# මහ බැංකුවේ ගිණුම් හා කටයුතු

1967 වසර සඳහා මහ බැංකුවේ මූල්‍ය ගිණුම් II වැනි පරිශිෂ්ඨයේ 6 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වේ. 1966 වර්ෂය හා සසඳන කල ප්‍රධාන වෙනස් කම් වූයේ:-

| | වෙනස | |
|---|---|---|
| | රුපියල් දශලක්ෂ | සියයට ගණන |
| මුළු ඉල්ලුම් වගකීම | + 314·4 | + 20·6 |
| මුදල් සංසරණය | + 79·1 | + 8·0 |
| ඉල්ලුම් තැන්පතු | + 178·2 | + 33·3 |
| (මෙයින් වෙළෙඳ බැංකුවල) | + 57·1 | + 63·7 |
| ජාත්‍යන්තර සංචිතය | + 117·4 | + 82·1 |
| දේශීය වත්කම් | + 182·0 | + 11·6 |
| (මෙයින් රජයේ හා රජය ඇපවූ සුරැකුම්පත්) | + 109·0 | + 8·7 |

+ වැඩිවීම

ලංකා රුපියල 1967 නොවැම්බර් 22 වැනි දින අව ප්‍රමාණය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්, ස්ටර්ලින් පවුම්, ඉන්දියානු රුපියල් සහ එක්සත් ජනපද ඩොලර් සඳහා වූ මහ බැංකු විනිමය අනුපාතිකයන්, පහත දක්වෙන පරිදි සංශෝධනය වුණි:-

| | | විදුලි පැවරුම් මගින් මිලයට ගැනීම | විදුලි පැවරුම් මගින් විකිණීම |
|---|---|---|---|
| ස්ටර්ලින් පවුම (ලංකා රුපියලකට) | තැන් මිල | සිලිං 1 පැ. 453/64 | සිලිං 1 පැ. 413/16 |
| | ඉදිරි මිල (සමසක් දක්වා) | මාසයකට පැන්සයකින් 1/128 ගණනේ තැන් මිලට වට්ටම් කොට | මසකට පැන්සයකින් 1/128 ගණනේ තැන් මිලට අධිකයක් ඇතිව |
| ඉන්දියානු රුපියල් (සියයකට) | තැන් මිල | රු. 79 1/8 | රු. 79 3/16 |
| | ඉදිරි මිල (සමසක් දක්වා) | මසකට රුපියලකින් 1/32 ගණනේ තැන් මිලට වට්ටම් කොට | මසකට රුපියලකින් 1/32 ගණනේ තැන් මිලට අධිකයක් ඇතිව |
| ඇමෙරිකානු ඩොලර් (සියයකට) | තැන් මිල | රු. 592.25 | රු. 592.50 |
| | ඉදිරි මිල (තෙමසක් දක්වා) | රු. 592.25 | මසකට ශත -/25 ගණනේ තැන් මිලට අධිකයක් ඇතිව |

විවිධ විදේශීය මුදල් සඳහා පැවති වාණිජ බැංකුවල විනිමය අනුපාතිකයන් හිද, සංශෝධනයන් ඇති කරන ලදී. මෙම අනුපාතිකයන් 1 වැනි පරිශිෂ්ඨයෙහි දක්වේ.

මහ බැංකුවේ විදේශීය විනිමය ගනුදෙනු II වැනි පරිශිෂ්ඨයෙහි 11 වැනි ංඛ්‍යා සටහනෙහි දක්වේ.

රජයේ සුරැකුම් පත් හා නිශ්චිත සමහර ගනුදෙනු නිසා ඇති වන භාවිතීය පොරොන්දු නෝට්ටු ඇපයට තබා ගෙන දෙන අත්තිකාරම් සඳහා අය කරන, වර්ෂයකට සියයට පහක් වන මහ බැංකුවේ පොලි අනුපාතිකය නොවෙනස්ව පැවතුනි. සහතික මිල ක්‍රමය යටතේ වී මිලදී ගැනීම සඳහා සමුපකාර සමිතිවලට, වාණිජ බැංකු මගින් දෙන ලද අත්තිකාරම් මුදල් වෙනුවෙන් රජයේ සුරැකුම් පත් ඇපයට තබා, වෙළඳ බැංකු විසින් මහ බැංකුවෙන් ගත් ණය අත්තිකාරම් වලට අය කළ සියයට තුනේ වාර්ෂික පොලියද, නොවෙනස්ව පැවතුනේය. වී, රතුළූණු, රටළූණු මිරිස්, අර්තාපල්, අන්නාසි හා එළවලු නිෂ්පාදනයට සම්බන්ධවූ, සමුපකාර සමිතිවල භාවිතීය පොරොන්දු නෝට්ටු ඇපයට තබා ගෙන වෙළඳ බැංකු විසින් දෙන ලද ණය අත්තිකාරම් වෙනුවෙන් මහ බැංකුව දෙන ණය අත්තිකාරම් වලට වර්ෂයකට සියයට එකහමාරක පොලියක් නියම කෙරුනි. මෙම ප්‍රතිදානය ඡීම් වුයේ මහ බැංකුවේ මෙම පහසුකම් වලින් ප්‍රයෝජන ගැනීමට ඉදිරිපත් වන වාණිජ බැංකු පෙර කී නෝට්ටු කරුවන් ගෙන් වර්ෂයට සියයට අටකට නොවැඩි පොලියක් අය කළ හොත් පමණි. (ගෙවීම නියමිත දිනයට ඉටු කිරීමේදී සියයට තුනක ප්‍රතිදානයක් ද සමගය.) භාණ්ඩාගාර බිල් පත් සඳහා මහ බැංකුවේ වට්ටම් අනුපාතිකය, අවසන් වරට පිළිගත් ටෙන්ඩර් අනුපාතික සාමාන්‍යයෙන් සියයට $\frac{1}{8}$ තව දුරටත් පැවතින.

**ණය සහතික ක්‍රමය.**

වාණිජ බැංකු මගින් කෘෂිකාර්මික නිෂ්පාදනය වෙනුවෙන් සැපයෙන්නා වූ කෙටි කාලීන ණය සම්බන්ධයෙන් ණය සහතික කිරීමේ ක්‍රමයක් 1967 සැප්තැම්බර් 1 වැනිදා ආරම්භ කරන ලදී. මේ සැලැස්ම යටතේ වී, රතුළූණු, රටළූණු, මිරිස්, අර්තාපල් අන්නාසි සහ එළවලු නිෂ්පාදනය සඳහා, වාණිජ බැංකු මගින් සමුපකාර සමිති වෙත සපයනු ලබන ණය පැහැර හැරීමේදී, රජය වෙනුවෙන්, මහ බැංකුව, එම ණය මුදල් වලින් සියයට හැත්තෑ පහක් ගෙවීමට සහතික කරයි. මෙසේ සහතික කිරීමේ ගාස්තුව වශයෙන් වාණිජ බැංකු සියයට එකෙන් අඩක් ගෙවිය යුතුය. 1967 දෙසැම්බර් 31 වැනි ද වන විට, මහ බැංකුව සහතික කර තිබුණු මුළු ණය ප්‍රමාණය රු. 70,718.522 ක් විය.

**මධ්‍ය හා දිගු කාලීන ණය**

1967 වර්ෂයේදී, මහ බැංකුව එහි දිගු කාලීන හා මැදි කාලීන ණය ක්‍රමය යටතේ ලබා දෙන දිගු කාලීන හා මැදි කාලීන ප්‍රති මුදල් කිරීමේ පහසුකම් වලින් රටේ ණය දෙන ආයතන වැඩිපුර ප්‍රයෝජන ගන්නට යෙදුනි. මේ වර්ෂයේ රු. 4,151.042 ක ප්‍රතිමුදල් ණය ප්‍රමාණයක් මෙම ආයතනයන් වෙත ලබා දුනි. මෙකී ප්‍රතිමුදල් කිරීමේ ණය වලින් වැඩි හරියක්ම, කර්මාන්ත සංවර්ධනය සඳහා එම ආයතන මගින් සැපයුන ණය මුදල් සම්බන්ධයෙන් වුනි. මහ බැංකුව මගින් සැපයුනු ප්‍රතිමුදල් වෙනුවෙන් අයවුනු පොලී අනුපාතිකයන් පහත දැක්වෙන පරිද්දෙන් නොවෙනස්ව පැවතුනි:-

(අ) කෘෂිකර්මයෙහි හෝ කර්මාන්තයන්හි සංවර්ධනයට හෝ වැඩි දියුණුවට වර්ෂයකට සියයට තුනයි.

(ආ) වෙළඳ, වාණිජ ව්‍යාපාරික සංවර්ධනයට හෝ වැඩි දියුණුවට වර්ෂයකට සියයට පහයි.

(ඇ) (තේ පාලක තැනගේ කර්මාන්ත ශාලා සංවර්ධන පිහිටාධාර ක්‍රමය යටතේ) තේ කර්මාන්තයට අවශ්‍ය යන්ත්‍ර මිලදී ගැනීම, තේ කර්මාන්ත ශාලා ගොඩනැගිම හා දියුණු කිරීමට වර්ෂයකට සියයට පහයි.

නෝට්ටු නිකුතුව:

1967 දී රුපියල් 100 සහ රු. 50 හේ අළුත් මෝස්තරයෙන් යුත් මුදල් නෝට්ටු නිකුත් වුනි; රුපියල් සියයේ අළුත් නෝට්ටුව පෙබරවාරියේ දී නිකුත් වූ අතර, රුපියල් පණහේ අළුත් නෝට්ටුව ඔක්තෝබරයේදී නිකුත් වුනි. රුපියල් සියයේ නෝට්ටුවෙහි, පොලොන්නරුවෙහි දක්නට ලැබෙන, සම්ප්‍රදායිකව මහ පැරකුම්බා රජතුමාගේ යයි විශ්වාස කරනු ලබන ප්‍රතිමාවෙහි අනු රුවක් ඇත.

නෝට්ටුවෙහි ප්‍රමාණය අඟල් 6 3/8 X 3 3/8 කි. එහි ඉදිරිපස ප්‍රධාන වශයෙන් අළු - නිල් සහ දුඹුරු පාටින් වන අතර, එහි මධ්‍යයෙහි, සංකීර්ණ සහ විවිධ පාටින් යුත් මෝස්තරයක් ද දක්නට ඇත. ප්‍රතිමාවෙහි අනු රුවක් නෝට්ටුවෙහි දකුණු පැත්තෙහි පනේලයක දිස්වන අතර, වම් පැත්තෙහි පනේලයක ලංකා සිංහ ලාංඡන දිය ලකුණ දක්නට ලැබේ. දකුණු පස සිරස් අතට ලෝහමය නූලක් ඇතුළු කොට තිබේ. නොට්ටුවෙහි පසුපස, සීගිරි බිතු සිතුවම්හි චිත්‍රයක අනුරුවක් දක්නට ලැබෙන අතර, ඉහළ සහ පහළ වාට්වල පනේලයන් හි කුඩා අකුරු ද ඇතුලත් කොට ඇත.

රුපියල් පනහේ නෝට්ටුවෙහිද, සම්ප්‍රදායිකව විශ්වාස කරනු ලබන පොලොන්-නරුවේ ඇති මහ පැරකුම්බා ප්‍රතිමාවේ අනුරුව දක්නට ඇත. නෝට්ටුවෙහි ප්‍රමාණය අඟල් 5 15/16X3 1/10 කි. එහි ඉදිරිපස (මුද්‍රණය කොට ඇත්තේ) ප්‍රධාන වශයෙන් නිල් සහ ලා දම්පාටින්ය. එය සංකීර්ණ සහ විවිධ වර්ණයේ මෝස්තරයක් මත හරි මැද දක්නට ඇති අතර, එම මෝස්තරය නෝට්ටුවේ ඉහළ සහ පහළ වාටීන් වෙත ද දිවේ. ප්‍රතිමාවෙහි අනුරුව නෝට්ටුවෙහි දකුණු පැත්තෙහි පනේලයක දිස්වන අතර, වම් පැත්තෙහි ලංකා සිංහ (ලාංඡන) දිය ලකුණ දක්නට ඇත. දකුණු පස, සිරස් අතට, ලෝහමය නූලක් ඇතුළු කොට තිබේ. නෝට්ටුවෙහි පිටු පස, ප්‍රධාන වශයෙන් නීල වර්ණයෙන් යුක්ත වන අතර, සඳකඩ පහනෙහි හා පියගැට පෙලක අනුරුවක් දක්නට ඇත. දකුණු පැත්තෙහි ඇති කවාකාර පනේලයක, විවිධ ප්‍රමාණවල කුඩා අකුරු පෙලක් ඇතුලත් කොට ඇත. අළුත් මොස්තරයේ නෝට්ටු ද, මෙයට කලින් නිකුත් කරන ලද, වලංගුව පවත්නා මුදල් නොට්ටු සමඟ සංසරණය වේ.

ආදායම් සහ වියදම්

මේ වර්ෂයේ මහ බැංකුවේ ආදායම රු. 23, 795,828 ක් වූ අතර, වියදම, සංචිත වෙන් කිරීම සහ බැංකු ගොඩනැගිල්ලෙහි වටිනාකම් ක්ෂයවීම වෙන් කිරීමත් සමඟ රු. 23,689,565 ක් විය. රු. 1.106,263 ක්වූ ශුද්ධ ලාභයෙන් රු. 1,06,263 ක ප්‍රමාණයක් මුදල් නීති පනතේ 39 (අ) ප්‍රකාර මූල්‍ය ගැලපීමේ ගිණුම ඇවර කිරීමට යොදන ලදී. මුදල් නීති පනතේ 39 (ආ) ප්‍රකාර රු. 1,000.000 ක ප්‍රමාණයක් අතිරික්තයක් වශයෙන් ඉදිරියට ගෙන යන ලදී.

බැංකු පරිපාලනය

මුදල් නීති පනතේ 29 (I) ඡේදය යටතේ, බැංකු පරිපාලන දෙපාර්තමේන්තුව 1967 දී බැංකු හයක් පරීක්ෂණයට භාජනය කරන ලදී. එයට අතිරේක වශයෙන් මුදල් නීති පණතේ 29 (2) ඡේදය යටතේ, මෙම දෙපාර්තමේන්තුව දීර්ඝ කාලීන ණය දෙන ආයතන දෙකක්ද පරීක්ෂණය කිරීමේ කාර්ය භාර ගත්තේය. බැංකු ගිණුම් විවෘත කිරීමේ කටයුතු පිළිබඳ 1961 අංක 65 දරණ මුදල් නීති පනතේ III කොටස ක්‍රියාත්මක කිරීම සම්බන්ධ කාර්යයන් දෙපාර්තමේන්තුව දිගටම කරගෙන යන ලදී.